8

මූල්‍ය අංශයේ කාර්යසාධනය සහ පද්ධති ස්ථායීතාව

අහියෝගාත්මක දේශීය හා ගෝලීය සාර්ව ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ වුවද, 2021 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළදී මූල්‍ය පද්ධතිය ස්ථාවරව පැවතුණි. ප්‍රමාණවත් ප්‍රාග්ධන මට්ටම් සහිතව බැංකු අංශය එහි ප්‍රධාන දර්ශකවලට අනුව ප්‍රසාරණයක් පෙන්නුම් කළේය. සමස්ත වත්කම් හා ණය කළඹ සුළු වශයෙන් ඉහළ යෑමත් සමඟ බලපත්‍රලාභී මුදල් සමාගම් අංශය මධ්‍යස්ථ කාර්යසාධනයක් වාර්තා කළේය. 2021 වසරේ පළමු භාගය තුළ දී අඛණ්ඩව අතිරික්ත තත්ත්වයක පැවති දේශීය මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාව 2021 ජූලි මස මැද වන විට සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, එය 2021 අගෝස්තු මස මැද සිට සෘණ අගයකට පත් විය. කොවිඩ්-19 වසංගතයේ බලපෑම හේතුවෙන් ඇති වූ සීමිත විදේශ විනිමය ගලා ඒම් හා සැසඳීමේ දී ණය සේවාකරණය විදේශ මුදලින් අඛණ්ඩව සිදුකිරීමේ අවශ්‍යතාව සමග දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ පීඩනයකට ලක් විය. සැලකිය යුතු උච්චාවචනයන් මධ්‍යයේ වුවද කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව ආකර්ෂණීය ක්‍රියාකාරිත්වයක් වාර්තා කරන ලදී. අඛණ්ඩ ශුද්ධ විදේශ ආයෝජන ගලායෑමක් පැවතියද, මිල දර්ශක, වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය සහ දේශීය ආයෝජකයින් විසින් මෙහෙයවනු ලබන දෛනික පිරිවැටුම අනුව ගත් කළ කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. වසංගතය හේතුවෙන් ඉහළ ගිය අවිනිශ්චිතතා මධ්‍යයේ වුවද මූල්‍ය යටිතල පහසුකම් මගින් මූල්‍ය අංශයේ සුමට ක්‍රියාකාරිත්වයක් සහතික කරන ලදී.

මූල්‍ය ආයතන

බැංකු අංශය

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් දේශීය හා ගෝලීය ආර්ථිකයන්හි සීමා වූ ආර්ථික ක්‍රියාකාරකම් මධ්‍යයේ වුවද, 2021 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළදී ප්‍රධාන දර්ශකවලට අනුව ගත් කල බැංකු අංශය පුළුල් වීමේ සලකුණු පෙන්නුම් කළේය. විදේශ විනිමය ද්‍රවශීලතාව සම්බන්ධව බැංකු අංශය මුහුණ දුන් අඛණ්ඩ ආතතිය මධ්‍යයේ වුවද, 2021 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළදී බැංකු අංශය ප්‍රමාණවත් ප්‍රාග්ධන මට්ටම්, ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතයන් සහ ප්‍රතිපාදන ආවරණ අනුපාතයන් සමගින් අඛණ්ඩව ක්‍රියාත්මක විය. තවද, ඉහළ නංවන ලද අවම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමේ අරමුණ පෙරදැරිව නව ප්‍රාග්ධනය රැස්කිරීම සහ ලාභ රඳවා තබා ගැනීම මගින් බැංකුවල ප්‍රාග්ධන අනුපාත වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, ණය කළඹේ කොටසක් ණය අත්හිටුවීම් සහනයන් යටතේ පවතින බැවින් බැංකුවල ද්‍රවශීලතාව නිරන්තරව නිරීක්ෂණය කළ යුතු වේ. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ගෝලීය හා දේශීය ආර්ථිකය තුළ අපේක්ෂිත මට්ටමට ළඟා නොවූ ආර්ථික ක්‍රියාකාරකම් හේතුවෙන් ඇති වූ ආර්ථික පසුබෑම නිසා බැංකු අංශය කෙරෙහි ඇති විය හැකි සෘජු හා වක්‍ර බලපෑම් සහ ලබාදුන් ණය අත්හිටවීමේ සහනයේ බලපෑම පිළිබඳ බැංකු අංශය පරික්ෂාකාරී විය යුතුය.

> **2021 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළදී සාර්ව ආර්ථික තත්ත්වයන්ගේ පසුබෑම් මධ්‍යයේ වුවද බැංකු අංශයේ කාර්යසාධනය වැඩි දියුණු විය...**

පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේදී 2021 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළදී බැංකු අංශයේ වත්කම්වල වර්ධනය වැඩි දියුණු විය. 2021 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළදී බැංකු අංශය සතු සමස්ත වත්කම් 12.1%කින් (රුපියල් ට්‍රිලියන 1.8කින්) රුපියල් ට්‍රිලියන 16.4 දක්වා ප්‍රසාරණය වූ අතර එය 2020 වසරේ ඊට අනුරූප කාලපරිච්ඡේදය තුළ වර්ධනය වූයේ 10.5%කිනි (රුපියල් ට්‍රිලියන 1.3කි).

2019 අවසානය වන විට වාර්ෂික ණය වර්ධන වේගය 5.6%ක් දක්වා අඩු ව තිබූ අතර එය 2020 වසරේ අවසානය වන විට 11.9% දක්වා ඉහළ ගොස්, 2021 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළදී තව දුරටත් වර්ධනය වෙමින් 2020 අගෝස්තු මස අවසානය වන විට 18.0% දක්වා ළඟා විය. 2020 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ දී මුළු ණය හා අත්තිකාරම්වල සිදුවූ රුපියල් බිලියන 725.6ක (8.9%) වාර්ෂික වර්ධනය සමග සසඳා බලන කළ, 2021 වසරේ එම කාලපරිච්ඡේදය තුළ දී මුළු ණය හා අත්තිකාරම්වල වර්ධනය රුපියල් ට්‍රිලියන 1.3ක් (14.8%) ලෙස වාර්තා වූ අතර, 2021 අගෝස්තු මස අවසානය වන විට එය රුපියල් ට්‍රිලියන 10.4 දක්වා ළඟා විය.

සලකා බලන කාලපරිච්ඡේදය තුළ ආයෝජන වර්ධනයේ අඩු වීමක් දක්නට ලැබුණි. බැංකු අංශයේ ආයෝජන, 2021 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළදී රුපියල් බිලියන 253.9ක (6.0%) වර්ධන වේගයක් වාර්තා කළද එය පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ පෙන්නුම් කළ රුපියල් බිලියන 598.3ක (19.8%) වර්ධන වේගයට වඩා අඩු අගයක් විය.

2021 වසරේ අගෝස්තු මස අවසානය වන විට බැංකු අංශයේ ප්‍රසාරණය සඳහා විශාල වශයෙන් අරමුදල් සපයනු ලැබුවේ තැන්පතු මගින් වන අතර එහි දායකත්වය මුළු වත්කම් ප්‍රමාණයෙන් 75.8%කි. බැංකු අංශයේ තැන්පතු පදනම රුපියල් ට්‍රිලියන 1.3කින් (12.0%) වර්ධනය වූ අතර මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් රුපියල් තැන්පතු හේතු විය. 2021 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළදී බැංකු අංශයේ මුළු ණය ගැනීම් රුපියල් බිලියන 285.8කින් (16.9%) වර්ධනය වූ අතර රුපියල් ණය ගැනීම මීට ප්‍රධාන වශයෙන් හේතු විය.

අක්‍රීය ණය අනුපාතය අනුව ගණනය කරනු ලබන බැංකු අංශයේ වත්කම්වල ගුණාත්මකභාවය පහත වැටීමක් පෙන්නුම් කළද එය කළමනාකරණය කළ හැකි මට්ටමක පැවතුණි. 2020 වසර අවසානයේදී රුපියල් බිලියන 448.1ක්ව පැවති අක්‍රීය ණය ප්‍රමාණය, 2021 වසරේ අගෝස්තු මස අවසානය වන විට රුපියල් බිලියන 46.9කින් (10.5%) වර්ධනය වෙමින් රුපියල් බිලියන 494.9ක් දක්වා ඉහළ යන ලදී. කෙසේ වුවද, ණය ගැනීම්වල ඉහළ වර්ධනයත් සමග, 2020 දෙසැම්බර් මස අවසානය වන විට 4.9%ක්ව පැවති අක්‍රීය ණය අනුපාතය, 2021 අගෝස්තු මස අවසානය වන විට 4.7% දක්වා අඩු විය. ණය අත්හිටුවීමේ සහන අවසන් වූ පසු අක්‍රීය ණය ඉහළ යා හැකි වුවද එහි බලපෑමෙන් විශාල කොටසක් වෙන්කිරීම් හරහා බැංකු විසින් දැනටමත් අවශෝෂණය කරගෙන ඇත.

අවම නියාමන අවශ්‍යතාවය වන 20% ඉක්මවන ලද ප්‍රමාණවත් ද්‍රවශීලතා ස්වාරක්ෂකයක් සමගින් බැංකු අංශය ක්‍රියාත්මක විය. දේශීය බැංකු ඒකක සහ අක්වෙරළ බැංකු ඒකකවල ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතයන් පිළිවෙළින් 36.1% සහ 32.6%ක් ලෙස පැවතුණි.

8.1 සංඛ්‍යා සටහන

බැංකු අංශයේ තෝරාගත් දර්ශක

අයිතමය	2019 අගෝ. අවසානයට	2020 අගෝ. අවසානයට (ඇ)	2020 දෙසැ. අවසානයට	2021 අගෝ. අවසානයට (අ)	වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස %	
					2020 අගෝ. (ඇ)	2021 අගෝ. (අ)
මුළු වත්කම් (රු. බිලියන)	12,072	13,834	14,666	16,446	14.6	18.9
ණය සහ අත්තිකාරම් (රු. බිලියන)	7,796	8,848	9,092	10,440	13.5	18.0
ආයෝජන (රු. බිලියන)	2,952	3,625	4,228	4,482	22.8	23.6
තැන්පතු (රු. බිලියන)	8,836	10,344	11,141	12,473	17.1	20.6
ණය ගැනීම් (රු. බිලියන)	1,621	1,737	1,692	1,978	7.1	13.9
ප්‍රාග්ධන අරමුදල් (රු. බිලියන)	1,096	1,206	1,254	1,401	10.0	16.2
පළමු පෙළ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (%) (ආ)	13.5	13.2	13.6	13.0		
මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (%) (ආ)	16.7	16.5	17.1	16.3		
දළ අක්‍රීය ණය අනුපාතය (%)	4.9	5.4	4.9	4.7		
ශුද්ධ අක්‍රීය ණය අනුපාතය (%)	3.1	3.1	2.4	2.2		
වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය බදු පෙර (%)	1.5	1.3	1.4	1.8		
හිමිකරු ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය (බදු පසු) (%)	10.8	10.6	11.4	15.9		
ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය (දේශීය බැංකු ඒකක) (%)	31.2	38.6	37.3	36.1		
මුළු වත්කම්වලට ද්‍රවශීල වත්කම් අනුපාතය (%)	29.3	34.6	33.7	31.4		

(අ) තාවකාලික
(ආ) ජුනි මස අවසානයට
(ඇ) සංශෝධිත

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

බැංකු අංශය සතු ශුද්ධ විදේශ විනිමය වත්කම් ප්‍රමාණය 2020 ජුනි මස අවසානය වන විට එ. ජ. ඩොලර් මිලියන 33.7ක්ව පැවතියද, විදේශ විනිමය වත්කම්වලට සාපේක්ෂව එම වගකීම් ඉහළ යෑම හේතුවෙන් 2021 ජුනි මස අවසානය වන විට බැංකු අංශය සතුව පැවති විදේශ විනිමය ශුද්ධ වත්කම් ප්‍රමාණය, එ. ජ. ඩොලර් මිලියන 84.8ක් වූ විදේශ විනිමය ශුද්ධ වගකීමක් දක්වා අඩු විය. 2020 ජුනි මස අවසානය වන විට රුපියල් බිලියන 6.3ක් ව පැවති විදේශ විනිමය වත්කම්වලට සාපේක්ෂව, 2021 ජුනි මස අවසානය වන විට බැංකු අංශය රුපියල් බිලියන 17.2ක වටිනාකමකට සමාන විදේශ විනිමය වගකීම් වාර්තා කළේය. තවද, 2020 වසරෙහි පළමු භාගය තුළ වාර්තා වූ රුපියල් බිලියන 12.8ක විදේශ විනිමය ප්‍රත්‍යාගණන ශුද්ධ ලාභයට සාපේක්ෂව, 2021 වසරෙහි පළමු භාගය තුළ වාර්තා වූ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ශුද්ධ ලාභය රුපියල් බිලියන 18.8ක් විය.

මෙම අංශයේ වාර්තා කරන ලද ආයෝජන මත ප්‍රාග්ධන ලාභ අඩු විය. භාණ්ඩාගාර බැඳුම්කරවල ප්‍රාග්ධන ලාභය 2021 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළදී රුපියල් බිලියන 4.5ක් ලෙස වාර්තා වූ අතර එය 2020 වසරේ සළකා බලන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ රුපියල් බිලියන 7.7ක ප්‍රාග්ධන ලාභයට වඩා අඩු අගයක් විය. ඉහළ ණය වර්ධනය හේතුවෙන් සාපේක්ෂව අඩු අරමුදල් ප්‍රමාණයක් රජයේ සුරැකුම්පත් වෙත යොමු වීම මේ සඳහා බොහෝදුරට හේතු විය.

සලකා බලන කාලපරිච්ඡේදය තුළ මෙම අංශයේ ලාභ වැඩි විය. බැංකු අංශයේ බදු පෙර ලාභය 2021 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළදී රුපියල් බිලියන 178.7ක් වූ අතර එය 2020 වසරේ අදාළ කාල සීමාව තුළ වාර්තා වූ රුපියල් බිලියන 111.8ක බදු පෙර ලාභය සමඟ සැසඳීමේ දී රුපියල් බිලියන 66.9ක වැඩිවීමකි. පසුගිය වසරේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව මෙම කාල සීමාව තුළ ලාභය ඉහළ යෑම සඳහා ශුද්ධ පොලී ආදායම (රුපියල් බිලියන 73.4) මෙන්ම පොලී නොවන ආදායම (රුපියල් බිලියන 23.5) ඉහළ යෑම ද, සාපේක්ෂව අඩු ණය අලාභ වෙන්කිරීම් ද (රුපියල් බිලියන 11.3) හේතු විය. 2020 අගෝස්තු මාසයේදී පැවති වත්කම් මත බදු පෙර ප්‍රතිලාභ සහ හිමිකම් මත ප්‍රතිලාභ, පිළිවෙළින්, 1.3% සහ 10.6%ක සිට 2021 අගෝස්තු මාසය වන විට, පිළිවෙළින්, 1.8% සහ 15.9% දක්වා වර්ධනය විය.

ඕනෑම අහිතකර කම්පනයක් අවශෝෂණය කර ගැනීම සඳහා 2021 මුල් භාගයේදී බැංකු අංශය මගින් ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් පවත්වා ගෙන යනු ලැබීය. 2021 ජුනි මස අවසානය වන විට 13.0%ක් වූ I වන අදියරේ ප්‍රාග්ධන අනුපාතයක් සහ 16.3%ක් වූ සමස්ත ප්‍රාග්ධන අනුපාතයක් සමඟ බැංකු අංශය ක්‍රියාත්මක වූ අතර, එය බාසල් III අවශ්‍යතාවයන්ට වඩා ඉහළ අගයක් විය.

රට තුළ මූල්‍ය අන්තර්ගතභාවය සඳහා පහසුකම් සලසමින්, 2021 වසරේ පළමු භාගය තුළ දී බැංකු ශාඛා ජාලය තවදුරටත් ව්‍යාප්ත විය. ඒ අනුව, 2021 වසරේ පළමු භාගයේදී ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 137ක් සවි කරන ලද අතර ශාඛා 02ක් විවෘත කරන ලදී. මේ අතර ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 10ක් සහ ශාඛා 01ක් වසා දමන ලදී.

සමීප අධීක්ෂණ කණ්ඩායම් පිහිටවීම මගින් ද, බලපත්‍රලාභී බැංකුවල ද්‍රවශීලතාව සහ ප්‍රාග්ධනය කෙරෙහි වූ ප්‍රධාන අවදානම්වල බලපෑම ඇගයීම සඳහා දිනපතා පූර්ව අනතුරු දර්ශක ප්‍රකාශ ලබා ගනිමින්ද, ආතති පරීක්ෂණ ගණනය කිරීම්වල, විදේශ විනිමය ණය ගැනීම්වල, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 9ට අනුව සකසන ලද ණය වෙන් කිරීමේ සටහන්වල හා කොවිඩ්-19 ට අදාළ ණය ආපසු ගෙවීම අත්හිටුවීමේ සහනවල විස්තර

විමසා බැලීම සඳහා වෙනත් වාර්තා ලබා ගැනීම මගින් ද අධීක්ෂණ කටයුතු සිදු කරගෙන යනු ලබයි. තවද, බැංකු වල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ සිදු කරන රැස්වීම්/සාකච්ඡා සඳහා අතථ්‍ය (virtual) වේදිකා වලට මාරු වෙමින් සහ ආරක්ෂිත දත්ත හුවමාරු කිරීමේ විසඳුම් හරහා කඩදාසි රහිත ලිපි ගනුදෙනු තවදුරටත් ක්‍රියාත්මක කරන අතර ස්ථානීය අධීක්ෂණ පැවැත්වීම සඳහා ඇති සීමා මැඩ ගැනීම සඳහා දුරස්ථ අධීක්ෂණ ක්‍රමයක් යොදා ගන්නා ලදී.

බලපත්‍රලාභී මුදල් සමාගම් අංශය

මුළු වත්කම් සහ ණය කළඹෙහි සිදු වූ සුළු වර්ධනය හේතුවෙන් 2021 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ දී බලපත්‍රලාභී මුදල් සමාගම් අංශය මධ්‍යස්ථ කාර්යසාධනයක් වාර්තා කළේය. 2021 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළදී මෙම අංශයේ සමස්ත වත්කම් පදනම රුපියල් බිලියන 9.5කින් (0.7%) වර්ධනය වූ අතර 2021 වසරේ අගෝස්තු මස අවසානය වන විට රුපියල් බිලියන 1,377.4 ලෙස පැවතුණි. වත්කම් කළඹේ වැඩි කොටසක් ණය සහ අත්තිකාරම් කළඹ නියෝජනය කරන අතර, 2021 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ දී එය රුපියල් බිලියන 29.1කින් (2.9%) වර්ධනය විය.

2021 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළදී මෙම අංශයේ තැන්පතුවල සහ ප්‍රාග්ධනයේ වැඩිවීමක් දක්නට ලැබුණු අතර ණය ගැනීමේ අඩුවීමක් දක්නට ලැබුණි. මෙම අංශයේ සමස්ත ණය ගැනීම් රුපියල් බිලියන 32.5කින් (10.4%) පහළ යෑමක් පෙන්නුම් කළේය. තැන්පතු පදනම රුපියල් බිලියන 17.3කින් (2.3%) වර්ධනය වූ අතර රුපියල් බිලියන 765.9ක අගයක් වාර්තා කළේය. අවම ප්‍රාග්ධන අවශ්‍යතා ඉහළ දැමීම සහ මහා පරිමාණ බලපත්‍රලාභී මුදල් සමාගම් කිහිපයක් ලාභ වාර්තා කිරීම හේතුවෙන්, සමස්ත ප්‍රාග්ධනය රුපියල් බිලියන 22.5කින් (11.0%) ඉහළ යෑමක් පෙන්නුම් කර ඇත. මෙම අංශයේ ද්‍රවශීලතා මට්ටම සතුටුදායක තත්ත්වයක පවතී.

> ***අහිතකර සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් 2021 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළදී බලපත්‍රලාභී මුදල් සමාගම් අංශය මධ්‍යස්ථ කාර්යසාධනයක් පෙන්නුම් කරන ලදී...***

8.2 සංඛ්‍යා සටහන

බලපත්‍රලාභී මුදල් සමාගම් අංශයේ ප්‍රධාන කාර්යසාධන දර්ශක

ප්‍රධාන කාර්යසාධන දර්ශකය	%	
	2020 දෙසැ. අවසානයට	2021 අගෝ. අවසානයට
දළ අක්‍රීය ණය	13.9	12.5
ශුද්ධ අක්‍රීය ණය	4.2	3.2
පළමු පෙළ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය	13.9	15.2
මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය	15.1	16.7
ශුද්ධ පොලී ආන්තිකය	6.9	8.1
වත්කම් මත ප්‍රතිලාභය	1.6	3.2
හිමිකම් මත ප්‍රතිලාභය	5.2	12.4
ආදායම සඳහා පිරිවැය	90.3	80.3

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

පෙර වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ දී වාර්තා කරන ලද බදු පසු ලාභය වන රුපියල් බිලියන 2.2ට සාපේක්ෂව, 2021 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළදී, මෙම අංශය විසින් රුපියල් බිලියන 33.0ක බදු පසු ලාභයක් වාර්තා කළේය. ශුද්ධ පොලී ආදායම සහ පොලී නොවන ආදායම, පිළිවෙලින්, රුපියල් බිලියන 15.2කින් සහ රුපියල් බිලියන 12.8කින් ඉහළ යෑම මෙන්ම ණය අලාභ වෙන් කිරීම් රුපියල් බිලියන 16.6කින් පහළ යෑම ලාභදායීත්වය ඉහළ යෑමට දායක විය. සලකා බලන කාලපරිච්ඡේදය තුළ මෙම අංශය සමස්ත වශයෙන් ලාභදායීත්වයක් පෙන්නුම් කළ ද, පාඩු ලැබූ බලපත්‍රලාභී මුදල් සමාගම් 10ක් පැවතුණි.

මෙම අංශයේ වත්කම්වල ගුණාත්මකභාවය සුළු වශයෙන් ඉහළ ගොස් ඇත. අක්‍රීය ණය රුපියල් බිලියන 11.9කින් (7.6%) පහළ යෑම සහ ණය සහ අත්තිකාරම් කළඹ රුපියල් බිලියන 31.6කින් (2.8%) ඉහළ යෑම හේතුවෙන්, 2021 අගෝස්තු මස අවසානය වන විට දළ අක්‍රීය ණය අනුපාතය 2020 වසරේ දෙසැම්බර් මස අවසානයේ දී වාර්තා කරන ලද 13.9%ට සාපේක්ෂව 12.5% දක්වා පහළ ගියේය. ශුද්ධ අක්‍රීය ණය අනුපාතය සහ වෙන් කිරීම් ආවරණ අනුපාතය, පිළිවෙලින්, 2020 දෙසැම්බර් මස අවසානයේ වාර්තා කරන ලද 4.2% සහ 58.9%ට සාපේක්ෂව, 2021 අගෝස්තු මස අවසානයේදී 3.2% සහ 64.5%ක් ලෙස වාර්තා විය. කෙසේ වුව ද, ණය සහන කාලය යටතේ ණය පහසුකම් වර්ගීකරණය සහ වෙන්කිරීම් නොකරන බැවින්, මෙම අංශයේ අක්‍රීය ණය ඉහළ යා හැකිය.

විචක්ෂණ රෙගුලාසි නිකුත් කිරීම, නියාමන අනුමැතිය ලබා දීම සහ අවසරයකින් තොරව මුදල් ව්‍යාපාර පවත්වාගෙන යන සමාගම් පිළිබඳව විමර්ශනය

කිරීම ඇතුලත්ව නියාමන කාර්යයන් සිදු කරමින්, මහ බැංකුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම්වල ව්‍යවස්ථාපිත පරීක්ෂණ (ස්ථානීය අධීක්ෂණය) සහ අඛණ්ඩ සුපරීක්ෂණය (ස්ථානීය නොවන අධීක්ෂණය) පවත්වන ලදී. මෙම ප්‍රධාන කාර්යයන් හැරුනු විට, මෙම අංශයේ ශක්‍යතාවය වැඩි දියුණු කිරීම, අධිකරණ කටයුතුවලට පහසුකම් සැලසීම සහ මහජන පැමිණිලි සඳහා අවධානය යොමු කිරීම සිදු කරන ලදී.

විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්

මෙම අංශයේ සමස්ත වත්කම් ප්‍රමාණය 2021 අගෝස්තු මස අවසානය වන විට රුපියල් බිලියන 34.6ක් වූ අතර, 2021 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළදී රුපියල් බිලියන 0.9කින් (2.6%) සුළු වශයෙන් ඉහළ යන ලදී. ණය සහ අත්තිකාරම් රුපියල් බිලියන 28.2ක් වූ අතර, එය රුපියල් බිලියන 1.4කින් (4.8%) පහළ ගියේය. සමස්ත ප්‍රාග්ධනය රුපියල් බිලියන 3.1කින් (20.2%) ඉහළ ගිය අතර, 2021 අගෝස්තු මස අවසානය වන විට එය රුපියල් බිලියන 18.2ක් විය. 2021 අගෝස්තු මාසයෙන් අවසන් වන පළමු මාස අට තුළදී මෙම අංශය රුපියල් බිලියන 0.8ක බදු පසු ලාභයක් වාර්තා කළ අතර, පෙර වසරේ අදාළ කාල සීමාවේ බදු පසු ලාභය රුපියල් බිලියන 0.7ක් විය. 2020 වසරේ දෙසැම්බර් මස අවසාන වන විට දළ අක්‍රීය ණය අනුපාතය, ශුද්ධ අක්‍රීය ණය අනුපාතය, සහ වෙන් කිරීම් ආවරණ අනුපාතය, පිළිවෙළින්, 13.6%ක්, 5.3%ක් සහ 61.3%ක් ලෙස වාර්තා වූ අතර, එයට සාපේක්ෂව, 2021 අගෝස්තු මස අවසානය වන විට මෙකී අනුපාත පිළිවෙළින්, 15.0%ක්, 4.7%ක් සහ 68.9%ක් ලෙස වාර්තා විය.

ප්‍රාථමික අලෙවිකාර සමාගම්

ප්‍රාථමික අලෙවිකාර සමාගම් අංශය 2021 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළදී ප්‍රධාන දර්ශකවලට අනුව සෘණ වර්ධනයක සලකුණු පෙන්නුම් කළේය. 2021 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළදී ප්‍රාථමික අලෙවිකාර සමාගම් හි සමස්ත වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 61.6ක් දක්වා 29.3%කින් පහළ ගිය අතර, එම සමාගම් හි රජයේ සුරැකුම්පත්වල සමස්ත ආයෝජන කළඹ රුපියල් බිලියන 49.0ක් දක්වා 38.8%කින් පහළ ගියේය. 2021 වසරේ අගෝස්තු මස අවසානය වන විට සියලුම සක්‍රීය ප්‍රාථමික අලෙවිකාර සමාගම් විසින් අවම අවශ්‍යතාව වන රුපියල් බිලියන 1.0ට වඩා වැඩි මූලික ප්‍රාග්ධනයක් පවත්වා ගන්නා ලදී. ප්‍රාථමික අලෙවිකාර සමාගම් හි සමස්ත අවදානම මත බර තැබූ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය, එහි අවම අගය වන 10%ට වඩා වැඩි අගයක පවත්වාගෙන යනු ලැබූ අතර, එය 2021 අගෝස්තු මස අවසානය වන විට 43.0%ක් විය. 2020 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළදී වාර්තා කරන ලද රුපියල් බිලියන 4.7ක ලාභයට සාපේක්ෂව, 2021 වසරේ පළමු මාස අට අවසානයේ දී, ප්‍රාථමික අලෙවිකාර සමාගම් විසින් රුපියල් මිලියන 95.2ක බදු පසු අලාභයක් වාර්තා කරන ලදී.

බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්

2021 අගෝස්තු මස අවසානය වන විට බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් හි සමස්ත වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 7.5ක් වූ අතර, ඉන් 70.0%ක් ණය සහ අත්තිකාරම් විය. ඒ අනුව, සලකා බලන කාලපරිච්ඡේදය තුළ බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් හි දළ ණය සහ අත්තිකාරම් 4.0%ක සුළු වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් බිලියන 5.9ක් ලෙස සටහන් විය. බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් හි අක්‍රීය ණය අනුපාතය 2020 දෙසැම්බර් මස අවසානයේ වාර්තා වූ 8.7% සිට 10.2%ක් දක්වා 2021 අගෝස්තු මස අවසානය වන විට ඉහළ ගියේය. 2021 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ මෙම අංශය රුපියල් මිලියන 166.0ක අලාභයක් වාර්තා කළේය.

රක්ෂණ අංශය

2021 වසරේ මුල් භාගයේ දී රක්ෂණ අංශය මිශ්‍ර කාර්යසාධනයක් වාර්තා කළේ ය. 2021 ජූනි මස අවසානය වන විට 2020 ජූනි මාසයට සාපේක්ෂව ජීවිත රක්ෂණ උප අංශයේ මුළු වත්කම් හා දළ ලියාහළ වාරිකය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර සාමාන්‍ය රක්ෂණ උප අංශයේ මුළු වත්කම් හා දළ ලියාහළ වාරිකයේ පහත වැටීමක් වාර්තා කළේ ය. රක්ෂණ අංශයේ සමස්ත වත්කම් සහ දළ ලියාහළ වාරිකය වාර්ෂිකව පිළිවෙළින්, 7.9%කින් සහ 10.7%කින් වර්ධනය විය. කෙසේ වෙතත්, එම අංශයේ බදු පෙර ලාභය පහත වැටුණු අතර 2020 වසරේ මුල් භාගයේ දී වාර්තා කළ රුපියල් බිලියන 18.2ට සාපේක්ෂව 2021 වසරේ මුල් භාගයේ දී රුපියල් බිලියන 14.5ක් වාර්තා කළේය.

ඒකක භාර

ඒකක භාර අංශයේ ක්‍රියාකාරිත්වය 2020 වසරේ අදාළ කාලයට සාපේක්ෂව 2021 ජූනි මස අවසානයේදී සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේ ය. 2021 ජූනි මස අවසාන වන විට මෙම අංශයේ ශුද්ධ වත්කම්වල වටිනාකම රුපියල් බිලියන 222.0ක් දක්වා වාර්ෂිකව 95.7%කින් ඉහල ගිය අතර ඒකක හිමියන්ගේ සංඛ්‍යාව 55,651ක්

දක්වා වාර්ෂිකව 16.2%කින් ඉහල ගොස් ඇත. මෙම අංශයේ ආයෝජනවල වටිනාකම රුපියල් බිලියන 222.7ක් ලෙස වාර්තා වූ අතර එය 94.8%ක සැලකිය යුතු වාර්ෂික වර්ධනයකි. 2021 ජූනි මස අවසානයේ දී ඒකක භාර විසින් රජයේ සුරැකුම්පත්වල ආයෝජිත වටිනාකම එම අංශයේ මුළු ශුද්ධ වත්කම්වල වටිනාකමින් 10.6%ක් වූ අතර එම අගය 2020 ජූනි මස අවසානයේ දී 7.5%ක් ලෙස වාර්තා විය.

කොටස් තැරැව්කාර සමාගම් අංශය

2021 වසරේ පළමු භාගයේ දී කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ කටයුතු පුළුල් වීම හේතුවෙන්, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සසඳන විට 2021 ජූනි මස අවසානයේ දී කොටස් තැරැව්කාර සමාගම්වල සමස්ත ක්‍රියාකාරීත්වයේ වර්ධනයක් වාර්තා විය. 2021 වසරේ පළමු භාගය තුළ කොටස් තැරැව්කරුවන්ගේ සාමාන්‍ය පිරිවැටුම රුපියල් මිලියන 1,553.0ක් දක්වා වාර්ෂිකව 250.6%කින් ඉහළ ගොස් ඇති අතර එම අංශයේ බදු පෙර ලාභය රුපියල් මිලියන 910.0ක් දක්වා වාර්ෂිකව 476.0%කින් ඉහළ ගොස් ඇත.

විශ්‍රාම අරමුදල්

ශ්‍රී ලංකාවේ විශාලතම විශ්‍රාම අරමුදල වන සේවක අර්ථසාධක අරමුදලේ වත්කම් පදනම 2021 අගෝස්තු මස අවසානය වන විට රුපියල් ට්‍රිලියන 3.1 ඉක්මවීය. සේවක අර්ථසාධක අරමුදලෙහි සමස්ත සාමාජික ගිණුම් ප්‍රමාණය 2020 දෙසැම්බර් මස වන විට මිලියන 19.8ක් දක්වා ඉහළ ගියේය. 2021 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ දී සමස්ත දායක මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 101.8ක් දක්වා 2.3%කින් වර්ධනය වූ අතර, ප්‍රතිලාභ ආපසු ගෙවීම් රුපියල් බිලියන 72.1ක් දක්වා 2.3%කින් අඩු විය. ඊට සාපේක්ෂව 2020 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ සමස්ත දායක මුදල් ප්‍රමාණය සහ ප්‍රතිලාභ ආපසු ගෙවීම් පිළිවෙළින් රුපියල් බිලියන 99.5ක් සහ රුපියල් බිලියන 73.8ක් ලෙස වාර්තා විය. ඒ අනුව, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී ශුද්ධ දායකත්වය රුපියල් බිලියන 29.7ක් විය.

8.3 සංඛ්‍යා සටහන
සේවක අර්ථසාධක අරමුදලෙහි තෝරාගත් දර්ශක

අයිතමය	2020 අගෝ. අවසානයට	2021 අගෝ. අවසානයට (අ)	වෙනස %
මුළු දායකත්වය (රු. බිලියන) (ආ)	99.5	101.8	2.3
මුළු ප්‍රතිලාභ ගෙවීම් (රු. බිලියන) (ආ)	73.8	72.1	- 2.3
මුළු වත්කම් (රු. බිලියන)	2,714.4	3,062.0	12.8
මුළු ආයෝජන කළඹ (රු. බිලියන)	2,711.9	3,037.9	12.0
එයින් රජයේ සුරැකුම්පත් (%)	93.7	93.7	-
දළ ආදායම (රු. බිලියන) (ආ)	172.5	211.2	22.4

(අ) තාවකාලික
(ආ) අදාළ වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන කාලය තුළ
මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සේවක අර්ථසාධක අරමුදලේ සමස්ත ආයෝජන ප්‍රමාණය රුපියල් බිලියන 3,037.9ක් විය. සමස්ත ආයෝජනයන්ගෙන් 93.7%ක් නියෝජනය කළ රාජ්‍ය සුරැකුම්පත්වලින් මෙම ආයෝජන කළඹ ප්‍රධාන වශයෙන් සමන්විත විය. 2021 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන පළමු මාස අට තුළදී අරමුදලෙහි ඇස්තමේන්තුගත දළ ආයෝජන ආදායම රුපියල් බිලියන 211.2ක් ලෙස වාර්තා වූ අතර, 2020 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රුපියල් බිලියන 172.5 සමඟ සැසඳීමේදී මෙය 22.4%ක වර්ධනයකි.

8.4 සංඛ්‍යා සටහන
සේවා නියුක්තයන්ගේ භාර අරමුදලෙහි තෝරාගත් දර්ශක

අයිතමය	2020 ජූනි අවසානයට	2021 ජූනි අවසානයට (අ)	වෙනස %
මුළු දායකත්වය (රු. බිලියන) (ආ)	13.2	14.3	8.3
මුළු ප්‍රතිලාභ ගෙවීම් (රු. බිලියන) (ආ)	8.3	10.4	25.3
මුළු වත්කම් (රු. බිලියන)	362.7	398.2	9.8
මුළු ආයෝජන කළඹ (රු. බිලියන)	343.1	377.0	9.9
එයින් රජයේ සුරැකුම්පත් (%)	80.3	83.4	3.9
දළ ආදායම (රු. බිලියන) (ආ)	16.9	17.1	1.4

(අ) තාවකාලික
(ආ) කාලපරිච්ඡේදය තුළ
මූලය: සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

මේ අතර, සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ මුළු වත්කම් වාර්ෂිකව 9.8%කින් වර්ධනය වූ අතර 2021 ජූනි මස අවසානයේ දී රුපියල් බිලියන 398.2ක් ලෙස වාර්තා විය. 2021 වසරේ මුල් මාස හය තුළ දී දායක මුදල් රුපියල් බිලියන 14.3ක් දක්වා 8.3%කින් ඉහළ ගිය අතර ප්‍රතිලාභ ආපසු ගෙවීම් රුපියල් බිලියන 10.4ක් දක්වා 25.3%කින් ඉහළ ගියේය. ඊට සාපේක්ෂව, 2020 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළදී සමස්ත දායක මුදල් සහ ප්‍රතිලාභ ආපසු ගෙවීම්, පිළිවෙලින්, රුපියල් බිලියන 13.2ක් සහ රුපියල් බිලියන 8.3ක් විය. අරමුදල විසින් කරන ලද ආයෝජන 2021 ජූනි මස අවසානයේදී 9.9%ක යහපත් වාර්ෂික වර්ධනයක් වාර්තා කළ අතර සමස්ත ආයෝජනයෙන් 83.4%ක් රජයේ සුරැකුම්පත්වලින් සමන්විත විය.

2021 ජූනි මස අවසානය වන විට පුද්ගලිකව කළමනාකරණය කරන අනුමත අර්ථසාධක අරමුදල් 117ක් පැවති අතර මේවා සේවකයින් 72,083කින් සමන්විත විය. අනුමත අර්ථසාධක අරමුදල් හි මුළු වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 169.6ක් වූ අතර එම අරමුදල් විසින්

ආයෝජනය කර ඇති මුදල රුපියල් බිලියන 144.7ක් ලෙස වාර්තා විය. 2021 ජූනි මස අවසානයේ දී රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ මුළු වත්කම් රුපියල් බිලියන 80.9ක් දක්වා වාර්ෂිකව 12.8%කින් වර්ධනය විය. එම අරමුදල විසින් කරන ලද මුළු ආයෝජන 2021 ජූනි මස අවසානයේ දී රුපියල් බිලියන 77.6ක් වූ අතර සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී සාමාජික ශේෂයන් මත ගෙවූ ප්‍රතිලාභ අනුපාතිකය 8.0%ක් විය.

8.3 මූල්‍ය වෙළඳපොළ

දේශීය මුදල් වෙළඳපොළ

2020 සහ 2021 වසරේ ප්‍රථම භාගය තුළදී අඛණ්ඩව අතිරික්ත මට්ටමක පැවති දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව 2021 ජූලි මස මැද භාගය වන විට සැලකිය යුතු ලෙස අඩු වූ අතර, 2021 අගෝස්තු මස මැද භාගයේ දී වෙළඳපොළ ද්‍රවශීලතාව හිඟයක් බවට පරිවර්තනය විය. විදේශීය ණය ගෙවීම්, ව්‍යවහාර මුදල් සංසරණය ඉහළයෑම මෙන්ම, මහ බැංකුව විසින් දැරූ භාණ්ඩාගාර බිල්පත් සහ මහ බැංකුවේ විදේශ විනිමය හුවමාරු ගිවිසුම් පරිණත වීම වැනි සාධකවල බලපෑම හේතුවෙන් අතිරික්ත ද්‍රවශීලතාව අඩු විය. 2021 සැප්තැම්බර් මස 01 දින ඇරඹෙන සංචිත පවත්වා ගැනීමේ කාලසීමාවේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ප්‍රතිශතාංක 2.00කින් 4.00% දක්වා ඉහළ නැංවීමත් සමග රුපියල් බිලියන 170ක පමණ ද්‍රවශීලතාවක් වෙළඳපොළ වෙතින් අවශෝෂණය කර ගන්නා ලදී.

> **2021 වසර ආරම්භයේදී අතිරික්ත මට්ටම්වල පැවති දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව ජූලි මස මැද භාගය වන විට අඩු වූ අතර, 2021 අගෝස්තු මස මැද භාගයේ දී වෙළඳපොළ ද්‍රවශීලතාව හිඟයක් බවට පරිවර්තනය විය...**

ඒ අනුව, 2020 වසර අවසානයේදී රුපියල් බිලියන 206.7ක් ලෙස පැවති වෙළඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව 2021 සැප්තැම්බර් මස අවසානය වන විට රුපියල් බිලියන 119.6ක හිඟ ද්‍රවශීලතා මට්ටමක් ලෙස වාර්තා විය. මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව මුදල් වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සිදු කිරීම මගින් එක්දින ද්‍රවශීලතාව හිඟ මට්ටමක පවත්වා ගැනුණි. කෙසේ වෙතත්, ඇතැම් බැංකු මත ඇති ද්‍රවශීලතා පීඩනය අවම කිරීම සඳහා 2021 සැප්තැම්බර් මස අවසානයේදී මහ බැංකුව විසින් එක් දිගුකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසියක් පවත්වන

8.1 රූප සටහන

නිත්‍ය පොළී අනුපාතික කොරිඩෝව, විවට වෙළඳ කටයුතු, වෙළඳපොළ ද්‍රවශීලතාව සහ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ලදී. තවද, මහ බැංකුව රජය සමග සිදු කළ ගනුදෙනු හේතුකොටගෙන හිඟ ද්‍රවශීලතාව යම් මට්ටමකට අඩුවූ අතර, වෙළඳපොළ ද්‍රවශීලතාව අවශෝෂණය කිරීම සඳහා 2021 වසරේ ඔක්තෝබර් මස මුල සිට මහ බැංකුව ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි පවත්වන ලදී. 2020 වසරේදී නිත්‍ය පොළී අනුපාතික කොරිඩෝවෙහි පහළ සීමාවෙහි තුළ පවත්වා ගන්නා ලද මුදල් ප්‍රතිපත්ති රාමුවෙහි මෙහෙයුම් ඉලක්කය වන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය 2021 වසරේදී මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව අඩු වීම මෙන්ම 2021 අගෝස්තු මාසයේදී ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ යෑමට අනුකූලව නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාව වෙත ගමන් කළේය. මෙම කාලසීමාව තුළදී බරිත සාමාන්‍ය වෙළඳපොළ ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය ද, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයට සමගාමීව හැසිරුණි. 2021 සැප්තැම්බර් මස අවසානය වන විට බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ බරිත සාමාන්‍ය වෙළඳපොළ ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය, පිළිවෙළින්, 5.94%ක් සහ 5.93%ක් ලෙස පැවතුණි.

දේශීය විදේශ විනිමය වෙළඳපොළ

2021 ජනවාරි සිට සැප්තැම්බර් මස දක්වා කාලය තුළ එ. ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල 6.8%කින් අවප්‍රමාණය විය. වසර ආරම්භයේ දී ආසන්න වශයෙන් රුපියල් 186ක මට්ටමේ පැවති විනිමය අනුපාතිකය, ඉහළ ආනයන වියදම් හා විදේශ මුදලින් සිදු කෙරෙන අඛණ්ඩ ණය සේවාකරණය මගින් විදේශ විනිමය වෙළඳපොළ තුළ ඉල්ලුම ඉහළ යෑමට සාපේක්ෂව කොවිඩ්-19 වසංගතය හමුවේ ඇති වූ බලපෑම නිසා සංචාරක කර්මාන්තය

පුනර්ජීවනය වීම ප්‍රමාද වීම සහ ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළට පිවිසීමේ දුෂ්කරතා වැනි හේතුමත විදේශ විනිමය සැපයුම සීමිත වීම හේතුවෙන් වසරේ මුල් මාස හතර තුළදී පීඩනයට ලක්විය. කෙසේ වෙතත්, මහ බැංකුව විසින් විදේශ විනිමය ද්‍රවශීලතාවය සැපයීම සහ මහ බැංකුව සහ රජය විසින් ලබා දුන් ප්‍රතිපත්තිමය උපදෙස් හා මගපෙන්වීම මත විනිමය අනුපාතය අවප්‍රමාණය වීම බොහෝදුරට සමනය වූ අතර, 2021 අගෝස්තු මස දක්වා වරින් වර සිදු වූ විචලනයන් හැරුණු විට එ. ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල 200-203 සීමාවේ පැවතුණි. මේ අතර, 2021 ජනවාරි සිට සැප්තැම්බර් මස දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල ජපාන යෙන්වලට සාපේක්ෂව අධිප්‍රමාණය වුවද ස්ටර්ලිං පවුම්, ඕස්ට්‍රේලියානු ඩොලර්, යුරෝ සහ ඉන්දීය රුපියලට සාපේක්ෂව අවප්‍රමාණය විය.

> ***සීමිත විදේශ විනිමය ගලා ඒම් සහ විදේශ මුදල් ණය සේවාකරණ ගෙවීම් සිදුවීම නිසා දේශීය විදේශ විනිමය වෙළඳපොළ මුහුණදීමට සිදුවූ දුෂ්කරත්වය මහ බැංකුව වෙළඳපොළට මැදිහත්වීම පෙළඹවීය...***

2021 වසරේ සැප්තැම්බර් මස අවසානය දක්වා කාලය තුළ මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ශුද්ධ විකුණුම්කරුවෙකු විය. ශ්‍රී ලංකා රුපියල්වලට හුවමාරු කරන ලද අපනයන ආදායමෙන් සහ විදේශීය ශ්‍රමිකයින්ගෙන් ලත් ප්‍රේෂණවලින් යම් ප්‍රමාණයක් මහ බැංකුව වෙත විකිණීමට බලපත්‍රලාභී බැංකුවලට නියෝග කිරීම මගින් ණය නොවන මූලාශ්‍ර ඔස්සේ දළ නිල සංචිත ඉහළ නංවා ගැනීම සඳහා විදේශ විනිමය අවශෝෂණය කරගැනීමට මහ බැංකුව විසින් පියවර ගනු ලැබූවද, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළ පවතින ද්‍රවශීලතා තත්ත්වය හේතුවෙන්, 2021 අගෝස්තු මස සිට රටේ අත්‍යවශ්‍ය ආනයන සඳහා විදේශ විනිමය සැපයීමට ශ්‍රී ලංකා මහ බැංකුවට සිදු විය. ඒ අනුව, 2021 ජනවාරි සිට සැප්තැම්බර් මස අවසානය දක්වා කාලය තුළ මහ බැංකුව විසින් එ.ජ. ඩොලර් මිලියන 331.8ක් වෙළඳපොළ වෙතින් අවශෝෂණය කර ගෙන ඇති අතර, එ.ජ. ඩොලර් මිලියන 342.6ක් වෙළඳපොළ වෙත සපයා ඇත. ඒ අනුව මහ බැංකුව විසින් ශුද්ධ පදනම මත එ.ජ. ඩොලර් මිලියන 10.7ක් වෙළඳපොළ වෙත සපයා ඇත.

2021 සැප්තැම්බර් මාසයෙන් අවසන් වන මාස නවය තුළ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි වෙළඳ පරිමාව සැලකිය යුතු ලෙස පහත වැටුණි. ඒ අනුව, එම කාලය තුළ අන්තර් බැංකු විදේශ විනිමය වෙළඳපොළෙහි සාමාන්‍ය දෛනික වෙළඳාම් පරිමාව, 2020 වසරේ එම කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 79.4ට සාපේක්ෂව, එ.ජ. ඩොලර් මිලියන 51.8ක් දක්වා, 34.7%කින් අඩු වී ඇත.

රජයේ සුරැකුම්පත් වෙළඳපොළ

2020 වසරේ මැද භාගයේ සිට 2021 වසරේ මුල් භාගය දක්වා භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළෙහි ඉතා අඩු ඵලදා අනුපාතිකයන් දක්නට ලැබුන අතර, ඉන් පසුව ඵලදා අනුපාතිකයේ ඉහළ යෑමක් සිදුවිය. හිතකර සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතා තත්ත්වයන්, සම්පත් ලබාගැනීමේ හැකියාව පදනම් කරගත් නිකුත් කිරීමේ ක්‍රමවේදය සහ 2020 වසරේ මැද භාගයේ සිට පැවති ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයන් සහ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික වෙන්දේසි සඳහා පිළිගත හැකි උපරිම ඵලදා අනුපාතික ප්‍රකාශයට පත් කිරීම හේතුවෙන් රජයේ සුරැකුම්පත් සඳහා ප්‍රාථමික වෙළඳපොළ සහ ද්විතීයික වෙළෙඳපොළෙහි පැවති ඉතා අඩු ඵලදා අනුපාතික, 2021 වසරේ මුල් භාගය දක්වා අඛණ්ඩව පැවතුණි. 2021 අගෝස්තු මාසය දක්වා, ඵලදා අනුපාතික මග පෙන්වීම මත පදනම්ව, මධ්‍යස්ථව වුවද, ඵලදා අනුපාතික ඉහළ යාමක් පෙන්නුම් කළේය. 2021 අගෝස්තු මාසයේ මැද භාගයේ දී ගනු ලැබූ මුදල් ප්‍රතිපත්ති තීරණ සහ රජයේ සැලකිය යුතු මූල්‍ය අවශ්‍යතා සහිත වාතාවරණයක් තුළ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික වෙන්දේසි සඳහා පිළිගත හැකි උපරිම ඵලදා අනුපාතිකයක් ප්‍රකාශ කිරීමෙන් ඉවත් වීමට ගත් තීරණය හේතුවෙන්, 2021 සැප්තැම්බර් මස මුල සිට රජයේ සුරැකුම්පත්වල ඵලදා අනුපාතිකය ඉහළ යෑම ආරම්භ විය. ඒ අනුව, 2021 සැප්තැම්බර් මාසයේ අවසානය වන විට, 2020 වසරේ අවසානයේ පැවති අනුපාතික වලට සාපේක්ෂව, දින 91, දින 182 සහ දින 364 යන භාණ්ඩාගාර බිල්පත්වල, ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික, පිළිවෙළින්, පදනම් අංක 185, පදනම්

8.2 රූප සටහන
රාජ්‍ය සුරැකුම්පත්වල ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය



මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

අංක 186 සහ පදනම් අංක 174 බැගින් ඉහළ යන ලදී. මේ අතර, 2021 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් මාසය දක්වා කාලය තුළ වසර 2 සිට වසර 8 දක්වා වූ කාලය තුළ කල්පිරෙන සක්‍රීයව වෙළඳාම් කරන භාණ්ඩාගාර බැඳුම්කරවල වෙළඳපොළ ඵලදා අනුපාතිකය පදනම් අංක 181 සිට පදනම් අංක 285 දක්වා පරාසයක ඉහළ ගොස් ඇත.

> ඉහළ ගිය ණය ගැනීමේ අවශ්‍යතා සහ මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම හේතුවෙන් රජයේ සුරැකුම්පත් වෙළඳපොළෙහි ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික ඉහළ ගියේය...

මේ අතර, රජයේ විශාල අරමුදල් අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් දිගු කාලයක සිට පවතින කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ වුවද, රාජ්‍ය සුරැකුම්පත්වල ප්‍රාථමික නිකුත් කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව හා විනිවිදභාවයෙන් යුතුව පවත්වාගෙන යෑමට, රජයේ ප්‍රතිපත්ති දිශානතිය අනුව රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ තුළ ක්‍රියාමාර්ග කිහිපයක් ආරම්භ කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී. ඒ අනුව, 2021 වසරේ පෙබරවාරි 03 දින සිට බලපැවැත්වෙන පරිදි භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවල දින 364 කල් පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත් සඳහා පමණක් ලංසු පිළිගැනීම උදෙසා උපරිම ඵලදා අනුපාතිකය ප්‍රකාශයට පත් කළ අතර, දින 91 සහ දින 182 කල් පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත්වල ලංසු, භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි වලදී, දින 364 පරිණත කාලය සඳහා ප්‍රකාශයට පත් කරන ඵලදා අනුපාතිකය තුළ පිළිගන්නා ලදී. තවද, භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි වලදී අදාළ සියළු කල්පිරීම් සහිත භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ලංසු පිළිගැනීම සඳහා උපරිම ඵලදා අනුපාතික තවදුරටත් ප්‍රකාශයට පත් කරන ලදී. ඒ සමගම ඉහළ යන රාජ්‍ය මූල්‍ය අවශ්‍යතාව වෙළඳපොළ තුළින්ම සපුරාගැනීමේ අභිප්‍රාය ඇතිව, 2021 සැප්තැම්බර් 22 දින සිට බලපැවැත්වෙන පරිදි සියලු භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි සඳහා උපරිම ඵලදා අනුපාතිකය ප්‍රකාශයට පත් කිරීම අත්හිටුවමින් රජයේ සුරැකුම්පත් නිකුත් කිරීමට කටයුතු කරන ලදී. තවද, 2021 සැප්තැම්බර් 23 දින සිට බලපැවැත්වෙන අවුරුදු 05 හෝ ඊට වඩා අඩු කල්පිරීමක් ඇති භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවලට පමණක් තුන්වන අදියර ක්‍රියාත්මක කිරීම සීමා කරමින්, වෙළඳපොළ නිෂ්කාශිත මිලක් ගොඩනැගීම තවදුරටත් තහවුරු කිරීම පිණිස භාණ්ඩාගාර බැඳුම්කර සම්බන්ධයෙන් පළමු අදියරෙහි අවම පිළිගැනීම දෙවන අදියර සඳහා ක්‍රියාත්මක කිරීමේදී පිළිගන්වන ලද ප්‍රමාණය 70% සිට 80% දක්වා ඉහළ නංවන ලදී. ඉහත දක්වන ලද වර්ධනයන්ට අමතරව, භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ මාර්ගගත නව නිකුත් කිරීමේ පද්ධතියක් 2021 වසරේ අවසානය වන විට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. භාණ්ඩාගාරයේ මුදල් ප්‍රවාහ කළමනාකරණයට තවදුරටත් පහසුකම් සැලසීමට සහ කාලානුරූපී අවස්ථා යටතේ හා වාසිදායක නියම යටතේ අරමුදල් රැස් කිරීමට, පළමු අදියරේදී සම්පූර්ණයෙන් පිළිගන්නා ලද ඕනෑම භාණ්ඩාගාර බැඳුම්කර මාලාවක් සමගින්, පසු වෙන්දේසියේදී පිරිනමන ලද ප්‍රමාණය 20%කින් ඉහළ නැංවීම සඳහා 2021 අගෝස්තු මාසයේ සිට භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ඍජු නිකුත් කිරීමේ කවුළුවක් හඳුන්වා දෙන ලදී.

කොටස් වෙළඳපොළ

සැලකිය යුතු උච්චාවචනයන් මධ්‍යයේ වුවද 2021 සැප්තැම්බර් මාසයෙන් අවසන් වන මාස නවය තුළ දී කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව ආකර්ෂණීය ක්‍රියාකාරීත්වයක් වාර්තා කරන ලදී. සමස්ත කොටස් මිල දර්ශකය සහ එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 මිල දර්ශකය 2020 වසර අවසානයට සාපේක්ෂව 2021 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට පිළිවෙලින් 39.6%ක සහ 34.0%ක වර්ධනයක් වාර්තා කරන ලදී. වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය 2020 වසර අවසානයට සාපේක්ෂව 2021 වසරේ සැප්තැම්බර් අවසානය වන විට 42.4%ක

8.5 සංඛ්‍යා සටහන
කොටස් වෙළඳපොළෙහි තෝරාගත් දර්ශක

අයිතමය	2019 අවසානයට	2020 සැප්. අවසානයට	2020 අවසානයට	2021 සැප්. අවසානයට
සමස්ත කොටස් මිල දර්ශකය (1985=100)	6,129.2	5,984.8	6,774.2	9,459.9
වසර ආරම්භයේ සිට වෙනස (%)	1.3	- 2.4	10.5	39.6
එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා20 දර්ශකය (2004=1,000)	2,937.0	2,463.3	2,638.1	3,534.8
වසර ආරම්භයේ සිට වෙනස (%)	- 6.3	- 16.1	- 10.2	34.0
වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන)	2,851.3	2,595.8	2,960.6	4,215.6
ද.ජා.නි.යේ. ප්‍රතිශතයක් ලෙස (%)*	19.0	17.3	19.8	28.2
වෙළඳපොළ මිල ඉපැයීම් අනුපාතිකය	10.8	10.1	11.2	11.5
සාමාන්‍ය දෛනික පිරිවැටුම (රු. මිලියන)	711.2	1,481.6	1,899.0	4,455.0
ශුද්ධ සමුච්චිත විදේශීය මිලදී ගැනුම් (රු. බිලියන)	- 11,735.3	- 39,856.6	- 51,091.0	- 44,862.0
ලැයිස්තුගත කළ සමාගම් ගණන	289	285	283	287

*2020 වසරේ ද.ජා.නි. මත පදනම්ව (රු. බිලියන 14,973)

මූලය: කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව

8.3 රූප සටහන
කොටස් වෙළඳපොළ දර්ශක වල විචලනය



මූලය: කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව

වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 4,215.6ක පැවතුණි. 2021 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ දී වාර්තා කරන ලද සාමාන්‍ය දෛනික පිරිවැටුම, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වාර්තා කරන ලද රුපියල් බිලියන 1.5 සිට රුපියල් බිලියන 4.5ක් දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය විය. කෙසේ වෙතත්, කොටස් වෙළඳපොළේ ක්‍රියාකාරිත්වය දේශීය ආයෝජනයන් මගින් මෙහෙයවන ලදී. මුළු පිරිවැටුම සඳහා විදේශීය දායකත්වය සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පැවතුන අතර 2021 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වන මාස නවය තුළ දී රුපියල් බිලියන 44.9ක (එ.ජ. ඩොලර් මිලියන 226.2ක) විදේශ ආයෝජන පිටතට ගලායෑමක් වාර්තා විය.

2021 සැප්තැම්බර් මාසයෙන් අවසන් වන මාස නවය තුළ දී කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව වෙළඳපොළ යටිතල පහසුකම් සම්බන්ධව සැලකිය යුතු වැඩි දියුණුවක් පෙන්නුම් කරන ලදී. 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත බලාත්මක කිරීම, ඩිජිටල්කරණයේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීම, කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවෙහි බෙදාහැරීමට එදිරිව ගෙවීම් (DVP) යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම සහ දේශීය සමාගම්වලට කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවෙහි ඩොලර් වලින් දක්වන ලද ණය සහ ප්‍රාග්ධනය ඉහළ නැංවීමට ඉඩ සැලසීම සඳහා මූලික පියවර ගැනීම එම කාලපරිච්ඡේදය තුළ සිදු වූ ප්‍රධාන වර්ධනයන් කිහිපයකි.

සාංගමික ණය සුරැකුම්පත් වෙළඳපොළ

2021 සැප්තැම්බර් මාසයෙන් අවසන් වන මාස නවය තුළ දී සාංගමික බැඳුම්කර වෙළඳපොළ සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරන ලදී. 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී ආයතන 06ක් විසින් ණයකර නිකුත් කරමින් බිලියන 16.4ක් රැස් කරන ලද අතර ඒ හා සැසඳීමේදී කල 2021 සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ දී ආයතන 13ක් විසින් ණයකර නිකුත් කරමින් රුපියල් බිලියන 76.3ක් රැස් කරන ලදී. 2021 වසරේ සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී ණයකරවල ස්ථාවර පොලී අනුපාතික 8.00%ත් 12.00%ත් අතර පරාසයක පැවතුණු අතර එයට සාපේක්ෂව 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී පොලී අනුපාතිකය 9.50%ත් 13.25%ත් අතර පරාසයක පැවතුණි. කෙසේ වෙතත්, පසුගිය වසරට සමාන ආකාරයෙන් වාණිජ පත්‍ර වෙළඳපොළ 2021 වසරේ මුල් මාස හය තුළ දී සාපේක්ෂව අඩු ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. වාණිජ පත්‍රවල පොලී අනුපාතික 2020 වසරේ ජුනි මාසයේදී වාර්තා වූ 11.50%ත් 15.75%ත් අතර පරාසයක සිට 2021 වසරේ පළමු භාගය තුළ දී 6.25%ත් 11.5%ත් අතර පරාසයක් දක්වා තවදුරටත් පහත වැටුණි. තවද වසර තුළදී සුරැකුම්පත් හා විනිමය කොමිසන් සභාව කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව හා එක්ව ණය සුරැකුම්පත් පිළිබඳ නැවත මිලදී ගැනීමේ ගිවිසුම් ගණුදෙනු සිදු කිරීම සඳහා නව කවුන්ටරය හරහා වේදිකාවක් (over the counter platform) ක්‍රියාත්මක කළේය.

8.4 මූල්‍ය යටිතල පහසුකම්වල වර්ධනය

ගෙවීම් සහ පියවීම් පද්ධති

2021 වසර තුළදී, මහ බැංකුව විසින් ශ්‍රී ලංකාව තුළ ඩිජිටල් ගෙවීම් ප්‍රවර්ධනය සහ ජාතික ගෙවීම් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් ක්‍රියාමාර්ග කිහිපයක් ගත් අතර ජස්ට්පේ (JustPay) හි උපරිම ගනුදෙනු සීමාව රුපියල් 50,000 දක්වා වැඩිකිරීම, විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වන පොදු යාන්ත්‍රණයේ ගනුදෙනුවක් සඳහා අය කරන ගාස්තුව රුපියල් 50 සිට රුපියල් 30 දක්වා අඩු කිරීම, LANKAQR මගින් ආරම්භ කරන ගනුදෙනු සඳහා අඩු කරන ලද 0.5%ක උපරිම වෙළඳ වට්ටම් අනුපාතය තවදුරටත් පවත්වා ගැනීම ඉන් කිහිපයකි. එලෙසම ඩිජිටල් ගෙවීම් ක්‍රමවේද ආරක්ෂාකාරීව භාවිතා කිරීම සම්බන්ධයෙන් මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් කිහිපයක් ද පවත්වන ලදී. මහ බැංකුව සහ මූල්‍ය ආයතන යන ද්විත්වයම විසින් පවත්වන ලද ප්‍රවර්ධන වැඩසටහන් හේතුවෙන් LANKAQR පදනම් කරගත් ගනුදෙනුවල සැලකිය යුතු වර්ධනයක් නිරීක්ෂණය වී ඇති අතර, LANKAQR කේත නිකුත් කරන්නන් සහ ලියාපදිංචි වෙළෙඳුන් ගණන 2021 වසරේ පළමු මාස 6 තුළදී, පිළිවෙළින්, 17 සහ 255,874 දක්වා ඉහළ ගොස් ඇත. සියළුම ආකාරයේ ඩිජිටල් ගනුදෙනු සංඛ්‍යාව සහ ඒවායේ වටිනාකම සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇති අතර විශේෂයෙන්ම, අන්තර්ජාලය, ණයපත් සහ LANKAQR මාධ්‍යයන් හරහා සිදුකරන ගනුදෙනු ඒ අතර වේ. තවද, මහ බැංකුවෙහි අනුමැතිය ඇතිව ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ජාතික

8.6 සංඛ්‍යා සටහන

පළමු මාස 6 තුළ ගෙවීම් පද්ධති මගින් සිදු වූ ගනුදෙනු

ගෙවීම් පද්ධතිය	2020		2021 (අ)		වර්ධනය%	
	ප්‍රමාණය ('000)	වටිනාකම (රු. බිලියන)	ප්‍රමාණය ('000)	වටිනාකම (රු. බිලියන)	ප්‍රමාණය	වටිනාකම
විශාල පරිමාණයේ ගෙවීම් පද්ධති						
තත්කාලීන දළ පියවීම් පද්ධතිය	192.0	61,505.0	202.9	93,672.4	5.7	52.3
සුළු පරිමාණයේ ගෙවීම් පද්ධති						
ප්‍රධාන චෙක්පත් නිශ්කාශන පද්ධතිය	15,822.2	3,450.5	16,838.6	4,015.3	6.4	16.4
ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය	17,905.9	1,045.9	19,952.4	1,331.6	11.4	27.3
ණයපත්	20,519.5	101.8	23,349.0	126.2	13.8	24.0
හරපත්	31,269.9	87.1	48,411.9	137.8	54.8	58.2
අන්තර්ජාල බැංකු කටයුතු	24,643.2	1,958.2	49,179.8	2,750.5	99.6	40.5
දුරකථන බැංකු කටයුතු (ආ)	11,871.8	232.7	16,390.6	263.2	38.1	13.1
එකතුව	**122,224.5**	**68,381.2**	**174,325.2**	**102,297.0**	**42.6**	**49.6**

(අ) තාවකාලික
(ආ) ජංගම දුරකථන සහ ස්ථාවර දුරකථන ආශ්‍රිත බැංකු කටයුතු

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8.7 සංඛ්‍යා සටහන

පළමු මාස 6 තුළ LANKAQR තොරතුරු (අ)

විස්තරය	2020		2021	
	ප්‍රමාණය	වටිනාකම (රු.'000)	ප්‍රමාණය	වටිනාකම (රු.'000)
LANKAQR ගනුදෙනු	131	844	590,660	1,017,222
වෙළෙඳුන් ලියාපදිංචිය (සලකන ලද කාලය අවසානයේදී)	28,832	-	255,874	-

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ගමනාගමන කොමිෂන් සභාව වැනි අදාළ පාර්ශවකරුවන් සමඟ මාර්ගස්ථ පෙරගෙවුම් කාඩ්පතක් (National Transit Card) හඳුන්වාදීමට සැලසුම් කර ඇත. මූල්‍ය සේවාවල නවෝත්පාදනයන් කිරීම සඳහා බ්ලොක්චේන් තාක්ෂණයට ඇති හැකියාව අධ්‍යනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආරම්භ කරන ලද බ්ලේක්චේන් තාක්ෂණය පදනම් කරගත් ඔබගේ ගනුදෙනුකරු හඳුනාගැනීම සඳහා වන හවුල් ක්‍රමවේදයේ සංකල්ප සාධනය (Proof of Concept) වැඩිදියුණු කිරීමේ යෝජනාවලිය සාර්ථකව ඇගයීමට ලක් කරන ලදී.

> ***පාර්ශවකරුවන් විසින් මුහුණපාන අවදානම් සඳහා විචක්ෂණශීලී ලෙස ක්‍රියාමාර්ග ගන්නා අතරම පුද්ගලයින්ගේ සහ ආයතන වල ගෙවීම් සහ පියවීම් අවශ්‍යතා කාර්යක්ෂම ලෙස සපුරාලමින් ජාතික ගෙවීම් යටිතල පහසුකම මගින් රටේ ආර්ථික කටයුතු සඳහා පහසුකම් සැලසීම අඛණ්ඩව සිදු කරන ලදී...***

ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමවේදය යටතේ ගෙවීම් කාඩ්පත් නිකුත් කිරීම ප්‍රවර්ධනයට සහ LANKAQR පිරිවිතරයන් අනුගමනය කරන මූල්‍ය ආයතනවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට මහ බැංකුව සැලසුම් කරයි. තවද, මෑතකදී ලබා දුන් විද්‍යුත් මුදල් ගිණුම් හරහා මූල්‍ය ආයතනවල ඇති ගිණුම් වලට අරමුදල් තැන්පත් කිරීම වැනි සේවා වැඩිදියුණු කිරීම් ඇතුළුව ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධති ක්‍රියාකරුවන් විසින් සපයනු ලබන සේවාවන්හි ආරක්ෂාව සහ ඵලදායිතාව සහතික කිරීම සඳහා විද්‍යුත් මුදල් පද්ධති වල ක්‍රියාකාරිත්වය පිළිබඳව මහ බැංකුව අඛණ්ඩව නිරීක්ෂණය සහ අධීක්ෂණය කරනු ලබයි. තවද, මූල්‍ය වංචා සහ අක්‍රමිකතා වලින් මහජනතාව ආරක්ෂා කිරීම සඳහා ඩිජිටල් ගෙවීම් උපකරණවල සුරක්ෂිත භාවය පිළිබඳව දැනුවත් කිරීමට මහ බැංකුව පියවර කිහිපයක්ම ගන්නා ලදී.

විදේශ විනිමය නියාමනය සහ සුපරීක්ෂණය

2017 අංක 12 දරණ විදේශ විනිමය පණත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි, විධිවිධාන සහ නියෝග මෙම වසර තුළ සංශෝධනය කර නිකුත් කරනු ලැබූ අතර එමගින් පාර්ශවකරුවන්ගේ විවිධ ගැටළු විසඳීමත්, පැහැදිලිතාවය තවදුරටත් වැඩිදියුණු කිරීමත් බලාපොරොත්තු වූ අතර රට තුළ විදේශ විනිමය ගනුදෙනු සඳහා තවදුරටත් පහසුකම් සැළසුණි.

වෙළෙඳපොල ද්‍රවශීලතාවය වැඩිදියුණු කිරීම සහ එමගින් පවත්නා විනිමය අනුපාතය ස්ථාවර කිරීම සඳහා සහාය දැක්වීමට 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ නියෝග නිකුත් කරන ලද අතර, එමගින් සෑම භාණ්ඩ අපනයනකරුවෙකුටම අපනයන ආදායම දින

180 ක කාලසීමාවක් තුළදී නැවත මෙරටට ගෙන්වීම සහ එම ආදායමෙන් යම් කොටසක් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීම අනිවාර්ය කරන ලදී. මෙම නියෝග ප්‍රථමයෙන්ම 2021 පෙබරවාරි මස මුලදී නිකුත් කරන ලද අතර, දේශීය විදේශ විනිමය වෙළෙඳපොල තත්ත්වය සළකා බලා නියෝග හතරක් පසුව නිකුත් කරන ලදී.

මේ අතර, රටේ විදේශ විනිමය සංචිත රැක ගැනීම සහ වෙළෙඳපොලින් හදිසි ගලායාම් වැළැක්වීම සඳහා විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ නියෝග නිකුත් කොට, බාහිර ප්‍රාග්ධන ගනුදෙනුවලට මෙන්ම සංක්‍රමණික දීමනාව යටතේ අරමුදල් සම්ප්‍රේෂණය සඳහා ද අදාළ සීමාවන්/අත්හිටුවීම් හඳුන්වා දෙන ලදී. රට තුලට විදේශ විනිමය ගලා ඒම සහ රඳවා තබා ගැනීම දිරිගැන්වීම සඳහා විශේෂ තැන්පතු ගිණුම් (Special Deposit Accounts) ආරම්භ කළ දින සිට උපරිම මාස 24ක් දක්වා, මාස හයේ සහ දොළහේ තැන්පතු ලෙස පවත්වා ගැනීමට අදාළ රෙගුලාසි ද විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලදී.

තවද, විදේශ විනිමය ප්‍රේෂණ ප්‍රවාහයන් සහ ආයෝජනයන් තුළින් අපේක්ෂිත ධනාත්මක ආර්ථික ප්‍රතිලාභ සළකා බලා අනේවාසිකයින් විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීම සඳහා අදාළ වන රෙගුලාසි සංශෝධනය කරන ලද අතර, එමගින් කොළඹ කොටස් වෙළෙඳපොළේ දේශීය සමාගම් විසින් විදේශ ව්‍යවහාර මුදලින් නිකුත් කරන ලද කොටස් සහ ණය සුරැකුම්පත් ලැයිස්තුගත කිරීමට සහ වෙළඳාමට ඉඩ සලසන ලදී. අතිරේකව, විදේශ විනිමය පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගම්වලට (මූල්‍ය ව්‍යාපාරවල නියුතු සමාගම් හැර) විදේශ ණය ලබා ගැනීමෙන් ද්විතියික වෙළෙඳපොලේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිළදී ගැනීමට පහසුකම් සැලසීම සඳහා නව රෙගුලාසි නිකුත් කරන ලදී.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම

ගෝලීය කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ වුවද, මූල්‍ය බුද්ධි ඒකකය, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අවශ්‍යතා සමග වාර්තා කරන ආයතන අනුකූල වීම සහතික කරමින් රටෙහි මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ පාලන තන්ත්‍රය ශක්තිමත් කිරීම සඳහා වන සිය කාර්යභාරය අඛණ්ඩව සිදු කළේය. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වූ තත්ත්වයන් හේතුවෙන් 2021 සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළදී එතැන් පරීක්ෂණ සිදුකිරීමේ හැකියාව සීමා වුවද, මූල්‍ය ආයතන මෙන්ම නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් සම්බන්ධයෙන් ඔවුන්ගේ අනුකූලතාවය සහතික කිරීම සඳහා තේමාත්මක අධ්‍යයනයන් (thematic studies) සහ එතැන් නොවන අධීක්ෂණයන් සිදුකරන ලදී. 2021 සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළදී මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2006 අංක 6 දරණ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ සහ ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීතින්හි දැක්වෙන නියමයන්ට අනුකූල නොවීම හේතුවෙන් මූල්‍ය ආයතන 9ක් සඳහා රුපියල් මිලියන 10.5ක දණ්ඩන පනවන ලදී.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම ආශ්‍රිත නීති, රීති හා රෙගුලාසිවලට සම්බන්ධ ආයතනික අනුකූලතාව ශක්තිමත් කිරීමේ අරමුණින් මූල්‍ය බුද්ධි ඒකකය වාර්තාකරණ ආයතන සඳහා මගපෙන්වීම් සිදුකරන ලද අතර, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ පියවරයන් සහ බැඳීම් පිළිබඳව පාර්ශවකරුවන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා වැඩසටහන් පැවැත්වීය. ඒ අනුව, 2021 සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළදී, මූල්‍ය බුද්ධි ඒකකය විසින් "සැක සහිත ගනුදෙනු වාර්තාකරණයෙහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම", "මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අරමුණු සඳහා සීසීටීවී මෙහෙයුම්" සහ "ගනුදෙනු අත්හිටුවීම සඳහා වූ මාර්ගෝපදේශ" ලෙස මාර්ගෝපදේශ 3ක් මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලදී. ඊට අමතරව, මූල්‍ය බුද්ධි ඒකකය විසින්, මෑත කාලීනව හඳුනාගත් ප්‍රවණතා කිහිපයක් පිළිබඳව චක්‍රලේඛ 4ක් වාර්තාකරණ ආයතන වෙත නිකුත් කරන ලදී.

2021 වසර තුළදී, මූල්‍ය බුද්ධි ඒකකය විසින් ලෝක බැංකුවේ තාක්ෂණික ආධාර ඇතිව මූල්‍ය කාර්ය සාධක බලකායේ නිර්දේශ අංක 1ට අනුකූලව මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමේ ජාතික අවදානම් තක්සේරුව යාවත්කාලීන කිරීමට ක්‍රියාමාර්ග ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකාව සඳහා වූ පළමු ජාතික අවදානම් තක්සේරුව 2014 වසරේ දී සිදු කරන ලද අතර, එහිදී මෙරට මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමේ අවදානම් මට්ටම "මධ්‍යස්ථ" ලෙස තක්සේරු කර ඇත. 2021 වසර සඳහා වූ ජාතික අවදානම් තක්සේරුව, 2014 වසරේදී තක්සේරු නොකළ නව අංශ 4ක් ඇතුළුව අංශ 13කින් සමන්විත වේ. සෑම අංශයකම මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමේ අවදානම හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම සම්බන්ධ කටයුතුවල

රාජ්‍ය හා පෞද්ගලික ආයතන 60කට වැඩි ප්‍රමාණයක නිලධාරීන් 120ක් පමණ නියැලී සිටියි. මෙම ක්‍රියාවලිය 2022 වසරේ මුල් භාගයේ දී අවසන් කිරීමට අපේක්ෂිත අතර, එහි ප්‍රතිඵල මත පදනම්ව ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාතික ප්‍රතිපත්තිය නැවත සළකා බලනු ඇත.

නිරාකරණ සහ බලගැන්වීම් ක්‍රියාමාර්ග

මහ බැංකුව මුදල් මණ්ඩලය විසින් බලපත්‍ර අවලංගු කරන ලද/ව්‍යාපාර අත්හිටවූ මුදල් සමාගම් හයක (06) තැන්පත්කරුවන් සඳහා ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ රක්ෂණ වන්දි ගෙවීම් අඛණ්ඩව සිදු කරනු ලබයි. මේ අතර මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ තැන්පත්කරුවකුට ගෙවිය හැකි උපරිම රක්ෂණ වන්දි මුදල රුපියල් 600,000 සිට රුපියල් 1,100,000 දක්වා වැඩි කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව, රුපියල් 1,100,000 දක්වා වැඩි වූ උපරිම රක්ෂණ වන්දි ගෙවීම් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ 2021 අප්‍රේල් 09 වැනි දින සිට ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් ක්‍රියාදාමයන් තවදුරටත් විධිමත් කිරීම සහ අදාළ වන නියාමන රාමුව ශක්තිමත් කිරීම සඳහා 2021 අගෝස්තු 06 දින සිට බලපැවැත්වෙන පරිදි 2021 අංක 02 දරණ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයෙහි රෙගුලාසි බලාත්මක කරන ලද අතර ඒ අනුව කලින් පැවති 2010 අංක 1 දරණ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රම රෙගුලාසි සහ පසුකාලීන රෙගුලාසි මගින් සංශෝධනය කරන ලද රෙගුලාසි අවලංගු කරන ලදී.

කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇතිවූ සීමාවන් නොතකා, මහ බැංකුව ගුවන් විදුලි/වීඩියෝ වැඩසටහන් වලට සහභාගී වීම, පුවත්පත් දැන්වීම් පල කිරීම සහ දැන්වීම් ප්‍රකාශයට පත් කිරීම සහ සමාජ මාධ්‍ය හරහා දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම වැනි විවිධ සන්නිවේදන මාර්ග භාවිතා කරමින් තහනම් යෝජනා ක්‍රම වල ආයෝජනය කිරීමේ අවදානම් පිළිබඳව මහජනතාව දැනුවත් කරන ලදී. තහනම් යෝජනා ක්‍රමවලට එරෙහි වීම පිළිබඳවද මහ බැංකුව සම්මන්ත්‍රණ පවත්වන ලදී. තහනම් යෝජනා ක්‍රම පිළිබඳව මහ බැංකුව විසින් පොලිසියේ සහයෝගයෙන් විමර්ශනයන් පවත්වා නීතිපති දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් අධිකරණමය ක්‍රියාමාර්ග ගනු ලැබීය. මහජනතාව සහ වෙනත් විවිධ පාර්ශවයන්ගෙන් ලද පැමිණිලි මත පදනම් ව නව විමර්ශනද මේ වන විට ක්‍රියාත්මක කරනු ලැබේ.

ගැටලුකාරී මූල්‍ය ආයතන වල නිරාකරණ කටයුතු ශක්තිමත් කිරීම සඳහා, දැනට පවතින නෛතික රාමුව තුළ කෙටුම්පත් කර ඇති, මහ බැංකුව විසින් නියාමනය සහ අධීක්ෂණය කරනු ලබන බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා වූ නිරාකරණ ප්‍රතිපත්ති රාමුව සකස් කිරීමේ කටයුතු අවසන් කිරීමට ද සැලසුම් කර ඇත. දත්ත වාර්තා කිරීම් වල ගුණාත්මකභාවය, නිරවද්‍යතාවය වැඩි කිරීම සහ දත්ත ආරක්ෂාව හා සම්බන්ධ අවදානම අවම කිරීමේ අරමුණින් මහ බැංකුව විසින් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයෙහි සියළුම සාමාජික ආයතනවල තැන්පත්කරුවන්ගේ දත්ත රැස් කිරීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව, එක් එක් තැන්පතුකරුවෙකුටම අනන්‍ය වූ හඳුනාගැනීමේ අංකයක් සාමාජික ආයතන විසින් සටහන් කිරීම ද අනිවාර්ය කිරීමට අපේක්ෂා කෙරේ.

සංවර්ධන මූල්‍ය සහ මූල්‍ය ප්‍රවේශය

2021 සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළදී මහ බැංකුව විවිධ ප්‍රතිමූල්‍ය, පොළී සහන සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම සම්බන්ධීකරණය කිරීම, පහසුකම් සැලසීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කරමින් පුළුල් පරාසයක ණය පරිපූරක සේවා සපයන ලදී. 2021 සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළදී මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම 7ක් සහ පොළී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම 2ක් යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතන මගින් ප්‍රතිලාභීන් 50,238 සඳහා රුපියල් මිලියන 15,229.1ක මුදලක් මුදාහරින ලදී.

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පීඩාවට පත් ව්‍යාපාරිකයන්ට සහ පුද්ගලයන්ට සහන සැලසීම සඳහා මහ බැංකුව සුවිශේෂී වූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග රාශියක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, සංචාරක ක්ෂේත්‍රයේ ද ණයගැතියන් ආවරණය වන පරිදි සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම යටතේ ණය ලබාගත් ප්‍රතිලාභීන් සඳහා ණය ආපසු ගෙවීමේ කාලය මාස 24 සිට මාස 36 දක්වා දීර්ඝ කිරීමත්, ලිඛිත ඉල්ලීම සිදු කල ප්‍රතිලාභීන් සඳහා ලබාදුන් ණය සහන කාලය 2021 සැප්තැම්බර් 30 දක්වා තව දුරටත් දීර්ඝ කිරීමටත් කටයුතු කරන ලදී. මීට අමතරව, අනෙකුත් ණය යෝජනා ක්‍රම කිහිපයක් සඳහාද ණය

සහන කාලය දීර්ඝ කිරීම සඳහා මාර්ගෝපදේශයන් නිකුත් කරන ලදී. සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට ලබාදෙන ණය සඳහා ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් සහ කිරි නිෂ්පාදන අංශය සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායි අංශ සංවර්ධනය සඳහා ණය ඇප ආවරණ සහ පොලී සහනාධාර යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරයි. තවද, තෝරාගත් කෘෂිකාර්මික අගය දාම තුනක් (කිරි, එළවලු, කුළුබඩු) යටතේ දේශීය කෘෂිකාර්මික අංශය සංවර්ධනය කිරීමට අවශ්‍ය පරිසරය සැකසීමට අදාල නියමු ව්‍යාපෘතියක් ශ්‍රී ලංකා මහ බැංකුව ආරම්භ කර ඇති අතර එය ඉදිරියේදී කෘෂිකාර්මික අගයදාම දහයක් යටතේ ජාතික වැඩසටහන් ලෙස ශ්‍රී ලංකා රජයේ සහාය ඇතිව දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරයි.

මහ බැංකුව විසින් 2021 මාර්තු මාසයේ දී ශ්‍රී ලංකාව සඳහා වන මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය සාර්ථකව දියත් කළ අතර, රටපුරා මූල්‍ය අන්තර්ගතභාවය හඳුනාගැනීම සහ ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගනිමින් මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබයි. තවද, හරිත ප්‍රවේශයන් හඳුන්වා දීම සහ එම ප්‍රවේශයන් මගින් ස්වභාවික සම්පත් කාර්යක්ෂම ලෙස පරිභෝජනය කිරීමට සහ පරිසර හානිය අවම කිරීමට දිරිගැන්වීම තුළින් ගෘහස්ථ ප්‍රජාවන් තුළ "හරිත" සංකල්පය ප්‍රවර්ධනය කිරීම සඳහා මහ බැංකුව විසින් නව ආදර්ශ ව්‍යාපෘතියක් හඳුන්වා දී ඇති අතර එමගින් ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ.

2021 සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ මහ බැංකුව විසින් පුහුණුකරුවන්, පුහුණු කිරීමේ වැඩසටහන් 08ක් ද රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් 18ක් ද පවත්වන ලද අතර විධිමත් මූල්‍ය අංශයෙන් බැහැරව සිටින පුද්ගලයින් ඉලක්ක කර ගනිමින් මූල්‍ය අන්තර්ගතභාවය සහ මූල්‍ය සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් 200 කට අධික ප්‍රමාණයක් මුළු දිවයිනම ආවරණය වන පරිදි පවත්වන ලදී. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පැවති බාධා මධ්‍යයේ වුවද, ඉහත වැඩසටහන් බොහොමයක් අලුතින් දියුණු කරන ලද මාර්ගගත ක්‍රමයන් භාවිතා කරමින් සිදු කිරීමට හැකියාව ලැබුණි.

මූල්‍ය පාරිභෝගික සබඳතා

මහ බැංකු සුපරීක්ෂණය යටතේ වන මූල්‍ය ආයතන සම්බන්ධ පැමිණිලි සහ විමසීම් 8,000 කට අධික සංඛ්‍යාවකට අදාල කටයුතු සඳහා මහ බැංකුව විසින් සිදු කර ඇති අතර 2020 වසරේ අගෝස්තු මාසයේ සිට මහජනතාවගෙන් ලද දුරකථන ඇමතුම් 60,000 කට අධික සංඛ්‍යාවකට මහ බැංකුවේ සම්බන්ධතා මධ්‍යස්ථානය හරහා පිළිතුරු සපයා ඇත. මේ වනවිට ලැබී ඇති පැමිණිලි අතරින් බොහොමයක් කොවිඩ්-19 මගින් බලපෑමට ලක්වූ ව්‍යාපාර හා පුද්ගලයින්ගෙන් වූ අතර, එම පැමිණිලි, ණය සහන ලබාදීම, ණය පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම්, ඉහළ පොලී අනුපාත අයකිරීම්, වත්කම් නැවත අත්කර ගැනීම් සහ ණය පහසුකම් කලින් පියවීමේදී ඇතිවන ආරවුල් යන කරුණු සම්බන්ධයෙන් බව නිරීක්ෂණය විය.